**පූර්ණ ක්‍රියා පටිපාටිය , ආගමන සහ වීසා පටිපාටිය, ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන ආදිය සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා පහත ස්ථාන වලින් විමසන්න.**

**අධිකරණ අමාත්‍යාංශය**

| කාර්යාල නම | ලිපිනය | ඇමතුම් විස්තර |
|---|---|---|
| මහජන සම්බන්ධතා අංශය, පොදු කටයුතු අංශය, අධිකරණ අමාත්‍යාංශයේ ආගමන හා විගමන සේවා ඒජන්සිය | 1-1-1 කසුමිගසෙකි, චියොදා-කු, තෝකියෝ | 03-3580-4111 |
| පොදු කටයුතු අංශය<br>සප්පොරෝ ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | සප්පොරෝ තෙවන ඒකාබද්ධ රජයේ ගොඩනැගිල්ල.,<br>12 ඕදෝරි-නිෂි, චූඕ-කු, සප්පොරෝ සිටි, හොක්කයිදෝ | 011-261-7502 (නියෝජිත) |
| පොදු කටයුතු අංශය<br>සෙන්දයි ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | සෙන්දයි දෙවන නීති කටයුතු ඒකාබද්ධ රජයේ ගොඩනැගිල්ල,<br>1-3-20 ගොරින්, මියගිනො-කු, සෙන්දයි සිටි, මියගි | 022-256-6076 (නියෝජිත) |
| ව්‍යාපාර හා රැකියා පරීක්ෂණ දෙපාර්තමේන්තුව අංක 3<br>තෝකියෝ ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | 5-5-30 කෝනන්, මිනතො -කු, තෝකියෝ | 0570-034-259 (දිගු අංකය. 330) |
| පොදු කටයුතු අංශය<br>යොකොහමා දිස්ත්‍රික් ආගමන සේවා කාර්යාලය, තෝකියෝ ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | 10-7 තොරිහමා-චෝ, කනසවා-කු, යොකොහමා නගරය, කනගවා | 045-769-1720 (නියෝජිත) |
| නගෝයා ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය<br>- පිළිගැනීම / සමාජ ඒකාබද්ධතාවය සම්බන්ධ<br>→ පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>- "විශේෂිත නිපුණතා" නේවාසික තත්වය සම්බන්ධ<br>→ ව්‍යාපාර හා රැකියා පරීක්ෂණ දෙපාර්තමේන්තුව අංක 2 | 5-18, ෂෝහෝ-චෝ, මිනාතො-කු, නගෝයා සිටි, අයිචි | පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>052-559-2112<br>ව්‍යාපාර හා රැකියා පරීක්ෂණ දෙපාර්තමේන්තුව අංක 2<br>052-559-2110 |
| පොදු කටයුතු අංශය<br>ඕසකා ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | 1-29-53 නන්කෝ-කිතා, සුමිනොඑ-කු, ඕසකා-ෂි, ඕසකා | 06-4703-2100 (නියෝජිත) |
| පොදු කටයුතු අංශය<br>කෝබේ දිස්ත්‍රික් ආගමන සේවා කාර්යාලය, ඕසකා ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | කෝබේ ප්‍රාදේශීය ඒකාබද්ධ රජයේ ගොඩනැගිල්ල,<br>29 කයිගන්-දෝරි, චූඕ-කු, කෝබේ-ෂි, හ්යෝගෝ | 078-391-6377 (නියෝජිත) |
| තත්ව දෙපාර්තමේන්තුව<br>හිරෝෂිමා ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | හිරෝෂිමා නීති කටයුතු රජයේ ගොඩනැගිල්ල,<br>2-31 කමී-හච්චෝබොරි, නකා-කු, හිරෝෂිමා-ෂි, හිරෝෂිමා | 082-221-4412 |
| පොදු කටයුතු අංශය<br>තකමත්සු ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | තකමත්සු නීති කටයුතු ඒකාබද්ධ රජයේ ගොඩනැගිල්ල.<br>1-1 මරුනොඋචි, තකමත්සු නගරය, කගවා | 087-822-5852 (නියෝජිත) |
| පොදු කටයුතු අංශය<br>ෆුකුඕකා ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | ෆුකුඕකා නීති කටයුතු රජයේ ගොඩනැගිලි සංකීර්ණය අංක 1<br>3-5-25 මයිසුරු, චූඕ-කු, ෆුකුඕකා නගරය, ෆුකුඕකා | 092-717-5420 (නියෝජිත) |
| වීසා තත්ව අංශය<br>නහා දිස්ත්‍රික් ආගමන සේවා කාර්යාලය, ෆුකුඕකා ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය | නහා පළමු පළාත් ඒකාබද්ධ රජයේ ගොඩනැගිල්ල,<br>1-15-15 හිගවා, නහා නගරය, ඔකිනවා | 098-832-4186 |

- "විශේෂිත නිපුණතා" නේවාසික තත්වය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය බලන්න.
→ "අධිකරණ අමාත්‍යාංශය විශේෂිත නිපුණතා ශ්‍රමික" ලෙස සොයන්න.

**විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය බලන්න.**

**විදේශීය ශ්‍රමිකයන් පිළිගැනීමේ නව ක්‍රමය 2019 අප්‍රේල් 1 වන දින ආරම්භ වේ!**

## නව නේවාසික තත්වයක්

# "විශේෂිත නිපුණතා ශ්‍රමික"

## ලෙස ආරම්භ කර ඇත.

මෙම ක්‍රමය, බරපතළ ශ්‍රම ඌනතාවයට ප්‍රතිචාර වශයෙන්, එක්තරා ප්‍රමාණයකට ප්‍රවීණතා හා නිපුණතා ඇති, සහ වහාම වැඩ ආරම්භ කල හැකි වූ විදේශිකයන් බඳවා ගැනීමේ ක්‍රමයකි.



### විශේෂිත නිපුණතා ශ්‍රමික (i)*

**විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍රවල, සැලකිය යුතු දැනුමක් හෝ පළපුරුද්දක් අවශ්‍යවන රැකියා වල නියැලී සිටින විදේශිකයින් සඳහා වන නේවාසික තත්වයකි.**

- වීසා වලංගු කාලය: වාර්ෂිකව, සෑම 6 මසකට හෝ සෑම 4 මසකට වරක්, උපරිම වශයෙන් එකතුව අවුරුදු 5 ක් දක්වා අලුත් කරනු ලැබේ.
- නිපුණතා ප්‍රමිති: විභාග මගින් පරීක්ෂා කෙරේ (තාක්ෂණික සීමාවාසික පුහුණු (ii) සාර්ථකව සම්පූර්ණ කළ අය පරීක්ෂණයෙන් නිදහස් වේ)
- ජපන් භාෂා ප්‍රවීණතාවය: එදිනෙදා ජීවිතයේ දී හා සේවා ස්ථානයේ දී භාවිතා වන ජපන් භාෂාවේ ප්‍රවීණතාවය විභාග යනාදිය මගින් පරීක්ෂා කෙරේ. (තාක්ෂණික සීමාවාසික පුහුණු (ii) සාර්ථකව සම්පූර්ණ කළ අය පරීක්ෂණ යනාදියෙන් නිදහස් වේ)
- පවුලේ සාමාජිකයින් සමග පදිංචිය: මූලික වශයෙන් අවසර නැත.
- සත්කාරක සංවිධානය හෝ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානය මගින් අනුග්‍රහ ලබා ගත හැක.

* "විශේෂිත නිපුණතා ශ්‍රමික" නේවාසික තත්වය සඳහා විශේෂිත නිපුණතා ශ්‍රමික (i) සහ විශේෂිත නිපුණතා ශ්‍රමික (ii) යනුවෙන් වර්ග දෙකක් ඇත. විශේෂිත නිපුණතා ශ්‍රමික (ii) යනු, විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අයත් ප්‍රවීණ කුසලතා අවශ්‍ය වන රැකියාවල නියුතු විදේශිකයින් සඳහා වන නේවාසික තත්වයකි.

**ජපාන ආගමන හා විගමන සේවා ඒජන්සිය**

特定技能 ンフ【シンハラ語】Ver2020-04-07.indd 1-4 2020/04/07 23:33

## විශේෂිත නිපුණතා ශ්‍රමික (i) සහිත විදේශිකයන් බඳවා ගැනීමේ දළ ක්‍රියා පටිපාටිය

පිට රටවල සිට ජපානයට පැමිණෙන විදේශිකයින්

ජපානයේ ජීවත් වන විදේශිකයින්
(මධ්‍යම සිට දීර්ඝ කාලීන පදිංචිකරුවන්)

- ජපානයට අලුතෙන් පැමිණෙන විදේශිකයින් → නිපුණතා විභාගය සහ ජපන් භාෂා විභාගය සමත් වීම
- තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii)සාර්ථකව අවසන් කර තිබෙන විදේශිකයින් → නිපුණතා විභාගය සහ ජපන් භාෂා විභාගයෙන් නිදහස් වීම
- තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii)සාර්ථකව අවසන් කර තිබෙන විදේශිකයින් → නිපුණතා විභාගය සහ ජපන් භාෂා විභාගයෙන් නිදහස් වීම
- විදේශීය ශිෂ්‍ය යනාදීන් → නිපුණතා විභාගය සහ ජපන් භාෂා විභාගය සමත් වීම

**[සත්කාරක සංවිධානය සමග රැකියා ගිවිසුම තීරණය කිරීම]**

**සත්කාරක සංවිධානය වෙතින් ප්‍රගමන උපදේශනය ලැබීම හා වෛද්‍ය පරීක්ෂණ ලබා ගැනීම**

**සුදුසුකම් සහතිකය සඳහා අයැදුම් කිරීම**

*සත්කාරක සංවිධානයේ කාර්ය මණ්ඩලය විසින් බලකාර (තමා වෙනුවට) අයැදුම කිරීම

**නේවාසික තත්වය වෙනස් කිරීම පිණිස අයැදුම**

*සම්මතයක් ලෙස, අයදුම්කරු තමන් විසින්ම අයදුම් කළ යුතු ය.

**දේශීය ආගමන හා විගමන කාර්යාංශය**



**සුදුසුකම් සහතිකය නිකුත් කිරීම**

**නේවාසික තත්වය වෙනස් කිරීමට අනුමැතිය**

වීසා අයැදුම

**විදේශීය තානාපති කාර්යාලය**

වීසා නිකුත් කිරීම

විදේශිකයින් සඳහා අවශ්‍යතා
◯වයස වසර 18 හෝ එයට වැඩි වීම
◯නිපුණතා/ජපන් භාෂා විභාගයකින් සමත් වීම. (තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii) සාර්ථකව අවසන් කර තිබෙන විදේශිකයන් මෙයින් නිදහස් කෙරේ)
◯විශේෂිත නිපුණතා ශ්‍රමික (i) වශයෙන් වසර 5 කට වඩා පදිංචිව නොසිටීම
◯ආරක්ෂක ඇපයක් ලබාගෙන නොමැති හා දණ්ඩන විස්තර කෙරෙන ගිවිසුමක් අත්සන් කර නොමැති වීම
◯ස්වයං අනුග්‍රාහක නම්, සිය වගකීම් ගැන විස්තර මුළුමනින්ම වටහා ගැනීම
යනාදිය

ජපානයට ඇතුල් වීම

[ජපානයට ඇතුල් වීමෙන් පසු (හෝ නේවාසික තත්වය වෙනස් වීමෙන් පසු) ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කල යුතු දෑ]
◯සත්කාරක සංවිධානය විසින් සලසන ජීවිතය පිළිබඳ පූර්ව උපදේශනයට සහභාගී වීම
◯පුද්ගලයා ජීවත් වන නාගරික ප්‍රදේශවල නේවාසිකයෙකු වශයෙන් ලියාපදිංචි වීම
◯වැටුප් බැංකු ගිණුමක් විවෘත කිරීම
◯නිවාස පහසුකම් ලබා ගැනීම
යනාදිය

**සත්කාරක සංවිධානයේ වැඩ ආරම්භ කිරීම**



## විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍ර සහ රැකියා

| | විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍ර | නිපුණතා අමාත්‍යාංශය හෝ කර්මාන්ත ක්ෂේත්‍ර ඒජන්සිය | නියැලෙන කාර්යයන් |
|---|---|---|---|
| 1 | හෙද සත්කාර | සෞඛ්‍ය, කම්කරු හා සුබසාධන අමාත්‍යාංශය | - හෙද සත්කාර සේවයට අමතරව (පරිශීලකයාගේ ශාරීරික හා මානසික තත්වයට අනුව ස්නානය, ආහාර ගැනීම සහ බහිස්‍රාවය සඳහා සහාය වීම) හා වෙනත් ආශ්‍රිත සත්කාර සේවා (විනෝදාස්වාද සහ ක්‍රියාකාරී පුහුණුව යනාදිය සඳහා සහය වීම)<br>සටහන: බාහිර සේවා ඇතුළත් නොවේ (පරීක්ෂණ කාණ්ඩ 1 කි) |
| 2 | ගොඩනැගිලි පිරිසිදු කිරීම | | - ගොඩනැගිලි ඇතුළත පිරිසිදු කිරීම (පරීක්ෂණ කාණ්ඩ 1 කි) |
| 3 | යන්ත්‍ර කොටස් සහ මෙවලම් කර්මාන්ත | ආර්ථික, වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශය | - වාත්තු කිරීම - ලෝහ තෙරපීම - නිමාකරණය - පෑස්සීම<br>- හැඩ තැළීම - කර්මාන්තශාලා තහඩු ලෝහ වැඩ - යන්ත්‍ර පරීක්ෂාව<br>- කැට වාත්තු කිරීම - ආලේපනය - යන්ත්‍ර නඩත්තු කිරීම<br>- යන්ත්‍රකරණය - ඇලුමිනියම් ඇනෝඩයිසින් - පින්තාරු කිරීම (පරීක්ෂණ කාණ්ඩ 13 කි) |
| 4 | කාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තය | | - වාත්තු කිරීම - පින්තාරු කිරීම - නිමාකරණය - විදුලි උපකරණ එකලස් කිරීම - පෑස්සීම<br>- හැඩතැළීම - යකඩ වැඩ - යන්ත්‍ර පරීක්ෂා කිරීම- මුද්‍රිත වයර් පුවරු නිෂ්පාදනය - කාර්මික ඇසුරුම්කරණය<br>- කැට වාත්තු කිරීම - කර්මාන්තශාලා තහඩු ලෝහ වැඩ - යන්ත්‍ර නඩත්තුව - ප්ලාස්ටික් අච්චු ගැසීම<br>- යන්ත්‍රකරණය - ආලේපනය - ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීම - ලෝහ තෙරපීම (පරීක්ෂණ කාණ්ඩ 18 කි) |
| 5 | විදුලි, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු කර්මාන්ත | | - යන්ත්‍රකරණය - නිමාකරණය - මුද්‍රිත වයර් පුවරු නිෂ්පාදනය - කාර්මික ඇසුරුම්කරණය<br>- ලෝහ තෙරපීම - යන්ත්‍ර නඩත්තු කිරීම - ප්ලාස්ටික් අච්චු ගැසීම<br>- කර්මාන්තශාලා තහඩු ලෝහ වැඩ - ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීම - පින්තාරු කිරීම<br>- ආලේපනය - විදුලි උපකරණ එකලස් කිරීම - පෑස්සීම (පරීක්ෂණ කාණ්ඩ 13 කි) |
| 6 | ඉදිකිරීම් කර්මාන්තය | ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය | - ආකෘති නිර්මාණය - පොළොවේ වැඩ - අභ්‍යන්තර නිමාකරණය / ද්‍රව්‍ය සවි කිරීම<br>- කපරාරු කිරීම - වහල තැනීම - කොන්ක්‍රීට් පොම්ප කිරීම - විදුලි සංදේශනය<br>- උමං මාර්ග සහ ප්‍රවාලනය - වැර ගැන්නූ කොන්ක්‍රීට් ඉදිකිරීම්<br>- ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ ඉදිකිරීම්<br>- වැර ගැන්නූ කොන්ක්‍රීට් සන්ධි<br>- පලංචි<br>- වඩු කාර්මික<br>- ජල නල කාර්මික<br>- ගොඩනැගිලි තහඩු ලෝහ වැඩ<br>- උණුසුම් හා සිසිල් කළමනාකරණය<br>- යුරේතන් තාප පරිවරණ ඉසීම<br>- අක්වෙරළ සිවිල් ඉංජිනේරු (පරීක්ෂණ කාණ්ඩ 18 කි) |
| 7 | නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය | | - පෑස්සීම - නිමාකරණය<br>- පින්තාරු කිරීම - යන්ත්‍රකරණ<br>- යකඩ වැඩ - විදුලි උපකරණ එකලස් කිරීම (පරීක්ෂණ කාණ්ඩ 6 කි) |
| 8 | මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | | - මෝටර් රථ එදිනෙදා පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම, නිතිපතා පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම, කොටස් කිරීම (පරීක්ෂණ කාණ්ඩ 1 කි) |
| 9 | ගුවන් සේවා කර්මාන්තය | | - ගුවන් තොටුපල පොළොවේ ක්‍රියාකාරකම් (බිම් ධාවන ආධාරක සේවා, ගමන් මලු සහ භාණ්ඩ ප්‍රවාහන සේවා)<br>- ගුවන් යානා නඩත්තු කිරීම (ගුවන් යානා සහ උපකරණ නඩත්තු කිරීම ආදිය) (පරීක්ෂණ කාණ්ඩ 2 කි) |
| 10 | හෝටල් කර්මාන්තය | | - පිළිගැනීමේ සේවා, සැලසුම් කිරීම / මහජන සම්බන්ධතා, ආගන්තුක සත්කාර, ආපනශාලා සේවා වැනි හෝටල් සේවා සැපයීම (පරීක්ෂණ කාණ්ඩ 1 කි) |
| 11 | කෘෂිකර්මාන්තය | කෘෂිකර්ම, වන විද්‍යා හා ධීවර අමාත්‍යාංශය | - සාමාන්‍ය බෝග ගොවිතැන (වගා කළමනාකරණය, කෘෂිකාර්මික නිෂ්පාදන එකතු කිරීම / නැව් ගත කිරීම / වර්ග කිරීම ආදිය)<br>- සාමාන්‍ය පශු සම්පත් ගොවිතැන (අභිජනන කළමනාකරණය, පශු සම්පත් නිෂ්පාදන එකතු කිරීම / නැව් ගත කිරීම / වර්ග කිරීම ආදිය) (පරීක්ෂණ කාණ්ඩ 2 කි) |
| 12 | ධීවර හා ජලජීවී වගාව | | - ධීවර කටයුතු (ධීවර ආම්පන්න නිෂ්පාදනය හා අලුත්වැඩියා කිරීම, සමුද්‍ර සතුන් හා පැළෑටි සෙවීම, ධීවර ආම්පන්න සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීම, සමුද්‍ර සතුන් හා පැළෑටි ඇල්ලීම සැකසීම හා ගබඩා කිරීම, සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම යනාදිය)<br>- ජලජීවී වගා කර්මාන්තය (ජලජීවී වගා ද්‍රව්‍ය නිෂ්පාදනය, අලුත්වැඩියා කිරීම සහ කළමනාකරණය, අභිජනන කළමනාකරණය, එකතු කිරීම (පලදාව නෙළීම) සහ ජලජීවී සතුන් සහ ශාක සැකසීම, සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම යනාදිය) (පරීක්ෂණ කාණ්ඩ 2 කි) |
| 13 | ආහාර පාන නිෂ්පාදනය | | - සාමාන්‍ය ආහාර පාන නිෂ්පාදනය (ආහාර පානවල නිෂ්පාදනය / සැකසුම හා සෞඛ්‍ය සහ ආරක්ෂාව (මත්පැන් හැර) (පරීක්ෂණ කාණ්ඩ 1 කි) |
| 14 | ආහාර සේවා කර්මාන්තය | | - සාමාන්‍ය අවන්හල් කර්මාන්තය (ආහාර පාන සැකසීම, පාරිභෝගික සේවය, ගබඩා කළමනාකරණය) (පරීක්ෂණ කාණ්ඩ 1 කි) |

## නිතර අසන ප්‍රශ්න

**ප්‍රශ්නය** **මව් රටේ අධ්‍යාපන පසුබිම අවශ්‍ය ද?**

**පිළිතුර** අයදුම්කරුවන්ගේ අධ්‍යාපන පසුබිම සම්බන්ධයෙන් විශේෂ අවශ්‍යතා නොමැත. කෙසේ වෙතත්, විශේෂිත නිපුණතා ශ්‍රමිකයින් සඳහා අවම වයස් අවශ්‍යතාවයක් ඇත - ඔවුන් වයස අවුරුදු 18 ට වැඩි විය යුතු ය.

**ප්‍රශ්නය** **විශේෂිත නිපුණතා ශ්‍රමික (ii) පිළිගන්නා ක්ෂේත්‍ර මොනවා ද?**

**පිළිතුර** “ඉදිකිරීම්” සහ “නැව් තැනීමේ හා නැව් යන්ත්‍රෝපකරණ” කර්මාන්ත සඳහා මෙය පිළිගැනේ

**ප්‍රශ්නය** **තාක්ෂණික සීමාවාසික පුහුණු (ii) සිට විශේෂිත නිපුණතා ශ්‍රමික (i) වෙත මාරු වීමේ දී, තාක්ෂණික සීමාවාසික පුහුණුවේ ක්‍රියාකාරකම් සහ විශේෂිත නිපුණතා ශ්‍රමිකයාගේ ක්‍රියාකාරකම් අතර කොපමණ අදාළත්වයක් අවශ්‍ය ද?**

**පිළිතුර** විදේශිකයන් නිරතව සිටින විශේෂිත නිපුණතා ශ්‍රමිකයාගේ ක්‍රියාකාරකම් සහ තාක්ෂණික සීමාවාසික පුහුණු (ii) ක්‍රියාකාරකම් අතර අවශ්‍ය අදාළත්වය, එක් එක් ක්ෂේත්‍රයේ අයදුම්පත් නිර්දේශ පත්‍රයේ සඳහන්ව ඇත. කරුණාකර නිර්දේශ පත්‍රය පරීක්ෂා කරන්න.

特定技能 ンフ【シンハラ語】Ver2020-04-07.indd 3-2 2020/04/07 23:33